


15 – පාඩම   සිරම්බි අඩිය

# 9 – ශ්‍රේණිය

# සිංහල භාෂාව

# 15 - පාඩම , සිරම්බි අඩිය

නිපුණතාව :-.9 .0 සංස්කෘතිය හ සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩ නගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි .

නිපුණතා මට්ටම :- 9 .4 විවිධ ජන කොටස්වට අයත් සිරිත් විරිත් හඳුනා ගැනිම සඳහා ලිපි ලේඛන ඇසුරු කරයි .

# ක්‍රියාකාරකම -1

**පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් √ ලකුණ ද වැරදි නම් X ලකුණ ද යොදන්න**

1 . මෙරටට ගෙන් වූ විවිධ ජන කොටස් මේ දිවයිනෙහි ස්ථිර පදිංචිකරුවන් බවට පත් විය .

2 . පෘතුගීසින් ඇමරිකාවෙන් වහල් සේවකයන් මෙරටට ගෙන්වා ඇත .

3 . සිලෝන් කැෆර්වරුන්ගේ නිජබිම අප්‍රිකාවයි .

4 . කැෆර්වරුන් ගේ නව පරපුර සම්ප්‍රදායික නැටුම් ,ගීත ,පොරබැදීම් , ප්‍රිය නැත .

5 . කැෆර්වරු මෙරටට ගෙන්වා ඇත්තේ තේ වගා කටයුතුවලට උදව් සඳහා ය .

6 . ‘ සිරම්බි අඩිය ’ගම්මානය පිහිටා තිබෙන්නේ ත්‍රිකුණාමල නගරය ආසන්නයේය .

7 . වර්තමානයේ කැෆර්වරු සිංහල හෝ දෙමළ භාෂාව භාවිත කරයි .

8 . තැපැල් සේවය කැෆර්වරුන්ගේ එක් රාජකාරියකි .

9 . කැන් කැන් නමින් හඳුන්වන්නේ මනාලියගේ ගවුමයි .

10 . ලොරෙන්සෝ ද අල්මේදා ඉංග්‍රීසි ජාතිකයෙකි .

# ක්‍රියාකාරකම 2

- පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න .

1 . 1815 දී …………………මුහුදු බඩ ප්‍රදේශය අල්ලා ගත්තේ ය .

2 . …………………. නගරයට ආසන්නයේ සිරම්බි අඩිය ගම්මානය පිහිටා ඇත .

3 . පෘතුගීසිහු ඔවුන්ගේ සහාය සඳහා ………………….. ගෝත්‍රික ජන කොට්ඨාසයක් මෙරටට ගෙන්වා ගත්හ .

4 . අප්‍රිකාවෙන් ගෙන්වන ලද ජන කොට්ඨාස …………………… යනුවෙන් හඳුන්වයි .

5 . ලොරෙන්සෝ අල්මේදා ප්‍රමුඛ හමුදාව ………………….. ජාතිකයෝ වෙති .

6 . සිලෝන් කැෆර්වරුන්ගේ මුල් වාසය ……………………වීදිය ප්‍රදේශයේ ය .

7 . කැෆර්වරුන්ගේ ගීත …………………… නමින් හඳුන්වයි .

8 . සිලෝන් කැෆර්වරුන් අප්‍රිකානු ………………… සම්භවයක් ඇත්තවුන් ය .

(කාපිරි මාඤ්ඤ පෘතුගීසි මොසැම්බික් අප්‍රිකානු
පුත්තලම පෘතුගීසින් සිලෝන්
සිලෝන් කැෆර්වරු කොම්පඤ්ඤ )



# සිලෝන් කැෆර්වරු



# ක්‍රියාකාරකම 3

❖ **1 . සිලෝන් කැෆර්වරුන්ගේ වාද්‍ය භාණ්ඩය 4 ක් මේ අතරෙන් තෝරා ලියන්න**

i . ………………………….

ii . ………………………….

iii . ………………………...

iv . ………………………….

වීණාව ,
ඩොල්කිය
පොල්කටු දෙක
රබාන
වයලීනය
ගිටාරය
බෝතලය හා කාසිය

2 . Eඑකල සිලෝන් කැෆර්වරුන් කරන ලද රාජකාරි 5 ක් මේ අතරෙන් තෝරා ලියන්න

i . ………………………………………….

ii . ………………………………………….

iii . ………………………………………...

iv . ………………………………………...

v ………………………………………..

★ ගම්මුලාදෑනි කටයුතු
★ බැංකු කටයුතු
★වෙළෙඳ කටයුතු
★ තැපල් කරත්තවල ආරක්ෂක නිළධාරි ලෙස කටයුතු කිරීම
★ගොවිතැන් කටයුතු
★ ලුණු ලේවායේ ආරක්ෂක කටයුතු
★ ලුණු ලේවාය පිරිසිදු කිරීම
★ යුද්ධ කාලයේ ආවතේව කාරයන් ලෙස කටයුතු කිරීම

# ක්‍රියාකාරකම 4

❖ **සාරාංශයක් ලිවීමේදී අවධානය යොමු කළ යුතු කරුණු පිළිබඳ ඉදිරිපත් කර ඇති පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් √ ලකුණ ද වැරදි නම් X ලකුණ ද යොදන්න.**

| | |
|---|---|
| 1 . ඡේදයේ අදහස වැටහෙන තුරු කීපවරක් කියවිය යුතු ය . | |
| 2 . පධාන අදහස්වල අදාළ වාක්‍ය යටින් ඉරි ඇඳිය යුතු ය . | |
| 3 . නිදර්ශන,උපමා විශේෂණ ආදි පද ඉවත්කිරීම | |
| 4 . දී ඇති ඡේදයේ වචන පමණක් භාවිත කළ යුතු ය . | |
| 5 . කරුණුවල වැදගත්කම අනුව පෙළ ගැස්විය යුතු ය . | |
| 6 . දී ඇති ඡේදයේ වචන ගණන් 3/1 ක් වන සේ සාරාංශය ලිවිය යුතු ය . | |
| 7 . ඡේද කිහිපයක් දී ඇත්නම් දෙන ලද ඡේද ගණන ම ලිවිය යුතු ය . | |
| 8 . මුල් ඡේදයේ අදහස වෙනස් නොවන ලෙස සාරාංශ කළ යුතු ය . | |
| 9 . තමා ලියන ලද සාරාංශ අග වචන සංඛ්‍යාව දැක්විය යුතු ය . | |
| 10 . දී ඇති ඡේදයක් සංක්ෂිප්තව නැවත ප්‍රකාශ කිරීම සාරාංශකරණය නම් වේ . | |

# ක්‍රියාකාරකම 5

- පහත සඳහන් ඡේදය එහි වචන සංඛ්‍යාව 3/1 එකක් වන සේ සාරාංශ කර ලියන්න . ඔබ ලියූ සාරාංශ අග වචන සංඛ්‍යාව සටහන් කරන්න .
- 1 . අතීතයේ අප රටේ ළමයින් හා යෞවන යෞවනියන් අතර බෙහෙවින් ජනප්‍රිය කලා මාධ්‍යයක් බවට පත් වී තිබුණේ චිත්‍ර කතා ය . හුදෙක් චිත්‍ර කතා පමණක් අන්තර්ගත වූ පත්‍ර කිහිපයක් සතිපතා **පලවිය** . මේවා මුද්‍රණද්වාරයෙන් පිටවූයේ සතියේ එක් එක් දිනවල නියමිත දිනයේ පමණි . චිත්‍ර කතා පත්‍ර කියවීමට ළමයින් හා නව යෞවනයන් සිටියේ නොඉවසිල්ලෙනි . බස් රියේ දි දුම්රියේ දි හා මගතොටේ දී පවා මහත් අවධානයෙන් හා අභිරුචියෙන් යුක්තව චිත්‍ර කතා කියවන්නෝ වූහ .
- 2 . පරිසරය ගැන වැඩි අවධානයක් යොමුවීම නිසා විසිවන ශතවර්ෂයේ අවසාන භාගයේ දී සම්පත් පිළිබඳ වාද විෂයයට අලුත් ගැටලුවක් ද එක් වී ඇත . ජන සංඛ්‍යාව හා පරිභෝජනය යන දෙ අංශයෙහි ප්‍රසාරණය හේතු කොටගෙන වර්තමානයේ භූමිය , ජලය හා අනෙකුත් ස්වභාවික සම්පත් සඳහා ඇති ඉල්ලුම ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවති . සම්පත් අවශ්‍යතාව හා පැවැත්ම අතරේ පවත්නා මේ නොගැළපෙන ස්වභාවය තීව්‍ර කිරීමට පරිසර අපයෝජනය පාදක වී තිබීම තව ගැටලුව කි .

# ප්‍රායෝගික අභ්‍යාසය

1 . "ශ්‍රීලංකාවේ ජීවත්වන විවිධ ජන වර්ග " යන මාතෘකාව යටතේ වචන 200 කට නොඅඩු රචනයක් ලියන්න .

2 . පහත සඳහන් ඡේදය එහි වචන සංඛ්‍යාව 3/1 එකක් වන සේ සාරාංශ කර ලියන්න . ඔබ ලියූ සාරාංශ අග වචන සංඛ්‍යාව සටහන් කරන්න .

පාසලින් අස්වන විට ම ඉගෙනීම අවසන් කළේ යයි බොහෝ දෙනා සිතතත් එය ඉමක් කොනක් නැති වැරදීමකි . ඔවුන් ඉගෙනීමේ නොහොත් පැවැත්මේ ගෘහය ගොඩ නැඟුවා නොව එහි අඩිතාලම හොඳින් හෝ නොහොඳින් දැමුවා පමණි . එබැවින් එතැන් සිට ජීවිත සූර්යයා අස්තංගත වන තෙක් ම යථෝක්ත මන්දිරයේ කඩතොල්ලක් වන්නේය . ඉගෙනීමට ප්‍රමාද වූයේ යැයි නොසිතන්න . එය තමා තුළ සිටින දුෂ්ට නාගයෙකුගේ සිතිවිල්ලක් විනා තම ඇදහීමක් නොවිය යුතු ය .

# පිළිතුරු

## ක්‍රියාකාරකම 1

1 . √

2 . X

3 . √

4 . √

5 . X

6 . X

7 . √

8 . √

9 . √

10 . X

## ක්‍රියාකාරකම 2

1 . පෘතුගීසින්

2 . පුත්තලම

3 . අප්‍රිකානු

4 . සිලෝන් කැෆර්වරු

5 . පෘතුගීසි

6 . කොම්පඤ්ඤ

7 . කාපිරි මාඤ්ජ

8 . මොසැම්බික්

## ❖ ක්‍රියාකාරකම 3

1 . සිලෝන් කැෆර්වරුන්ගේ වාද්‍ය භාණ්ඩය 4 ක් මේ අතරෙන් තෝරා ලියන්න

★ ඩොල්කිය

★ පොල්කටු දෙක

★ බෝතලය හා කාසිය

★ රබාන

2 . එකල සිලෝන් කැෆර්වරුන් කරන ලද රාජකාරි 5 ක් මේ අතරෙන් තෝරා ලියන්න

★ ලුණු ලේවාය පිරිසිදු කිරීම

★ ලුණු ලේවායේ ආරක්ෂක කටයුතු

★ ගම්මුලාදෑනි කටයුතු

★ යුද්ධ කාලයේ ආවතේව කාරයන් ලෙස කටයුතු කිරීම

★ තැපල් ආත්තවල ආරක්ෂක නිළධාරි ලෙස කටයුතු කිරීම

## ක්‍රියාකාරකම 4

1. √
2. √
3. √
4. **X**
5. √
6. **X**
7. √
8. √
9. √
10. **X**

## ක්‍රියාකාරකම 5

1 . චිත්‍ර කතා යෞවනයන් අතර ජනප්‍රිය කලා මාධ්‍යයකි . සතියේ එක් එක් දිනවල පලවන චිත්‍ර කතා පත්‍ර ලැබෙන තුරු යෞවනයන් නොඉවසිල්ලෙන් සිටිති . මේවා පොදු ස්ථානවල පවා කියවති .

( වචන 25 යි .)

2 . විසිවන සියවස අග දී පරිසරයට අවධානය යොමුවිය . ජනගහන ප්‍රසාරණය නිසා ස්වභාවික සම්පත් සඳහා ඉල්ලුම අධික වෙමින් පවති . සම්පත් අවශ්‍යතාව පැවැත් ම හා නොගැළපේ . සම්පත් ආයෝජනයෙන් එය තීව්‍ර වේ .

( වචන 25 යි .)